රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 32/91 (II)

මගේ අංකය :- ආ/IV/4/2-14
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998 මාර්තු මස 24 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.
දිසාපතිවරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්
ආණ්ඩුකාර ලේකම්වරුන් සහ
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
ලේකම්වරුන් වෙත.

**පළාත් පාලන ඡන්ද විමසීම්වලට ඉදිරිපත්වීම සඳහා සිය**
**තනතුරුවලින් ඉල්ලා අස්ව හෝ රාජකාරී නිවාඩු ලබා**
**<u>මැතිවරණවලට තරග කොට ජයගත් දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්</u>**

1991.10.31 දිනැති අංක 32/91(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. පළාත් පාලන ආයතන මැතිවරණයට ඉදිරිපත්වීම සඳහා සිය තනතුරෙන් ඉල්ලා අස්ව / නිවාඩු ලබා එම මැතිවරණය තරඟ කොට ජයගත් දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්ට පහත සඳහන් අනුග්‍රහ ලබා දිය යුතු යැයි අමාත්‍ය මණ්ඩලය 1998.02.18 දින තීරණය කර ඇත.

03. එවන් නිලධාරීහු පළාත් පාලන ආයතනයක උප සභාපති තනතුරට පත්වුවහොත් හෝ එවන් තනතුරක වැඩ බැලීමට පත් වුවහොත් හෝ පළාත් පාලන ආයතනයේ ලේකම් විසින් එය අදාල ලේකම්වරයාට අදාළ දින වකවානු සහිතව වහාම දැන්විය යුතුය. එවැනි තනතුරකට පත්වූ නිලධාරියා විසින් ද තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත වෙනම දැන්වීමක් කළ යුතු වේ. එවන් වාර්තාවක් ලද විට දෙපාර්තමේන්තු ප්‍රධානියා නිලධාරියාට අදාළ සම්පූර්ණ කාලය වැටුප් රහිත නිවාඩු තත්ත්වයේ තැබිය යුතුය.

04. මෙම විධිවිධාන 1998.02.18 දින සිට ක්‍රියාත්මක වේ.

අ.කලේ/(ඩික්සන් නිලවීර)
වැඩ බලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය